# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත

---

**[සහතිකය සටහන් කළේ 2006 මැයි මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 මැයි මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 15.00 යි. තැපැල් ගාස්තුව : රු. 7.50 යි

# 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 2006 මැයි මස 18 වන දින]

එල්. ඩී.— ඕ. 7/2005.

රටෙහි කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකත්ව අංශයේ විශේෂ අවධානය සහිතව ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යවසාය සංවර්ධනය, ප්‍රවර්ධනය කිරීම, ඊට සහායවීම, උනන්දු කරවීම සහ ඒ සඳහා පහසුකම් සැලැස්වීම සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පිහිටුවීම පිණිස ද ; ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

## ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පිහිටුවීම

2 (1) ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පිහිටුවීම.

(2) අධිකාරිය (1) වන උපවගන්තිය මගින් එයට දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, අධිකාරිය විසින් සහ එයට විරුද්ධව අධිකාරියේ නාමයෙන් නඩු පැවරීම සහ පවරනු ලැබීම කරනු ලැබිය හැකි ය.

3 (1) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු, පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන් විත, මණ්ඩලයක් සතු විය යුතු ය :— අධිකාරියේ මණ්ඩලයෙහි සංයුතිය.

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් දෙදෙනෙක්, එනම් —

(i) භාණ්ඩාගාර ලේකම් ; සහ

(ii) අධිකාරිය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ; සහ

2-P L 000946- 4,500 (2006/01)

(ආ) (මෙහි මින් මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) මුදල්, වෙළෙඳ, බැංකු, කෘෂිකර්මය, කර්මාන්ත තාක්ෂණ සහ නීති යන ක්ෂේත්‍ර පිළිබඳව පළපුරුද්ද සහ දැනුම ඇති තැනැත්තන් අතරින් තෝරා ගනු ලබන පත් කළ සාමාජිකයන් හත් දෙනකු ;

(2) මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් එක් අයකු අමාත්‍යවරයා විසින් සභාපති ලෙස තෝරාපත් කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට නුසුදුසුකම්.

**4**. යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා හෝ පළාත් පාලන ආයතනයක සාමාජිකයකු නම් හෝ සාමාජිකයකු වන්නේ නම් ;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම නතර වී ඇත්නම් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක නීතිය යටතේ සිහිවිකල තැනැත්තකු බවට සොයාගෙන ඇත්නම් හෝ ප්‍රකාශයට පත්කර ඇත්නම් ;

(ඈ) ශ්‍රී ලංකාව හෝ වෙනත් යම් රටක් විසින් පනවනු ලබන බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයක් විඳිමින් සිටින හෝ විඳ සිටින තැනැත්තකු වේ නම් ;

(ඉ) අධිකාරිය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් සාදන ලද ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ බුක්තිවිඳින්නේ නම් ;

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක නීතියක් යටතේ බුන්වත් හෝ බංකොලොත් භාවයට පත් තැනැත්තකු ලෙසට ප්‍රකාශයට පත් කරනු ලැබ බුන්වත් භාවයෙන් හෝ බංකොලොත්භාවයෙන් නිදහස් නොකරන ලද තැනැත්තකු වේ නම්,

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත්කර ගැනීම සඳහා නුසුදුසු තැනැත්තකු විය යුතු ය.

සාමාජිකයන් ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම.

**5**. (1) පත් කළ සාමාජිකයකු විසින්, අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් හේතු දක්වා පත් කළ සාමාජිකයකු ස්වකීය ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කර ඇති අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් 3 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඒ සාමාජිකයා වෙනුවට වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ පත්කළ සාමාජිකයකු විසින් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ශේෂ වී ඇති ධුර කාලය සඳහා ධුර දැරිය යුතු ය.

6. (1) 5 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ පත්කළ සාමාජිකයකුගේ ධුර කාලය, තමා මිය යෑම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා කලින් ධුරය හිස් කරන්නේ නම් මිස අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු අතර ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයකු හැර, එම සාමාජිකයා නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය. සාමාජිකයන්ගේ ධුර කාලය.

(2) ධුරයෙන් ඉවත් කරන ලද යම් පත් කළ සාමාජිකයකු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් නැවත පත් කිරීම සඳහා හෝ වෙනත් යම් ආකාරයකින් අධිකාරියේ සේවය කිරීම සඳහා නුසුදුසු විය යුතු ය.

7. (1) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටී නම් ඔහු මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටී නම්, එකී රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගෙන් එක් සාමාජිකයකු පැමිණ සිටින සාමාජිකයන් විසින් රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු ය. මණ්ඩලයේ රැස්වීම්.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හතරදෙනකු විය යුතු ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

8. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ පාරිශ්‍රමික අධිකාරියේ අරමුදලින් මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතු ය. සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් ක්‍රියා අවලංගු නොවිය යුතු බව.

**9**. මණ්ඩලයේ පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසා පමණක් හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් තිබීම නිසා මණ්ඩලයේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් අවලංගු වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

අධිකාරිය, රජයේ පොදු ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියා කළ යුතු බව.

**10**. අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කර්තව්‍ය ඉටු කිරීමේ දී සහ කාර්ය කිරීමේ දී, අධිකාරිය විසින් රජයේ පොදු ප්‍රතිපත්තියට සහ ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාළව අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද සාමාන්‍ය හෝ විශේෂ විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

අධිකාරියේ මුද්‍රාව.

**11**. (1) අධිකාරියේ මුද්‍රාව, මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි තැනැත්තකුගේ භාරයේ තැබිය යුතු ය.

(2) අධිකාරියේ මුද්‍රාව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ මුද්‍රාව, එහි සභාපතිවරයා සහ මණ්ඩලයේ යම් සාමාජිකයකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් දෙදෙනා එම සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය :

එසේ වුවද, අධිකාරියේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තැබීමේ දී පැමිණ සිටීමට සභාපතිවරයාට නොහැකිවන අවස්ථාවක දී, තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලිඛිතව බලය දෙන ලද මණ්ඩලයේ යම් වෙනත් සාමාජිකයකු විසින් මේ උපවගන්තියේ ඉහතින්ම වූ විධිවිධානවලට අනුකූලව එවැනි යම් සාධන පත්‍රයක් හෝ ලේඛනයක් අත්සන් කිරීමට නිසි බලය තිබිය යුතු ය.

(4) මණ්ඩලය විසින්, අධිකාරියේ මුද්‍රාව තබන්නා වූ සාධන පත්‍ර සහ ලේඛනවල රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු ය.

විශේෂ ආර්ථික කලාප ප්‍රකාශයට පත් කිරීම සහ කළමනාකරණය කිරීම.

**12**. (1) 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ විධිවිධාන ප්‍රකාරව-

"අවසරලත් කලාපයක්" හෝ "අපනයන සැකසුම් කලාපයක්" වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති යම් ප්‍රදේශයක් හැර, අමාත්‍ය මණ්ඩලය විමසා අධිකාරිය විසින් හඳුනාගනු ලබන ශ්‍රී ලංකාවේ යම් කොටසක පිහිටා ඇති ඉහත කී නියමයේ විස්තරකර ඇති යම් ඉඩම් ප්‍රදේශයක් "විශේෂ ආර්ථික කලාපයක්" වශයෙන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සංස්ථාපත්‍රයක් භාරදීමේ දී, (1) වන උපවගන්තිය යටතේ විශේෂ ආර්ථික කලාපයක් බවට ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශයක් කළමනාකරණය කිරීම සහ සංවර්ධනය කිරීමේ කාර්ය සඳහා එම සමාගම සංස්ථාපනය කිරීම අවශ්‍ය බවට අමාත්‍ය මණ්ඩලය තීරණය කරනු ලබන අවස්ථාවක දී, අමාත්‍ය මණ්ඩලය විසින්, අමාත්‍යවරයා වෙත මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත සාංගමික ව්‍යවස්ථාවලියක් සහ සංස්ථා පත්‍රයක් ඉදිරිපත් කරන ලෙස සහ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ එම සමාගම ලියාපදිංචි කරන ලෙස ද සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත විධාන කරනු ලැබිය හැකි ය.

(3) 1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තිය යටතේ විධානයක් ලැබීමේ දී, රෙජිස්ට්‍රාර්වරයා විසින් -

(අ) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධානයේ සඳහන් නාමයෙන්, 1982 අංක 17 දරන සමාගම් පනතේ 15 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සංස්ථාගත කිරීමේ සහතිකයක් නිකුත් කිරීම ; සහ

(ආ) එසේ සංස්ථාගත කරන ලද සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සහ සංස්ථාපත්‍රය ප්‍රකාර විශේෂ ආර්ථික කලාපයක් බවට ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයක් කළමනාකරණය කිරීම සඳහා ඉහත නියමයේ නිශ්චිතව දක්වා ඇති නාමයෙන් පොදු සමාගමක් සංස්ථාපනය කරනු ලැබ ඇති බවට ගැසට් පත්‍රයේ නියමයක් පළ කිරීම,

කරනු ලැබිය යුතු ය.

(4) සමාගමේ අරමුණු, බලතල සහ කර්තව්‍ය මෙහි උපලේඛනයේ දක්වා ඇති ආකාරයට විය යුතු ය.

### අධිකාරියේ අරමුණු සහ මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍යය

**13**. අධිකාරියේ අරමුණු වනුයේ — අධිකාරියේ අරමුණු.

(අ) ශ්‍රී ලංකාව තුළ කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධනය උනන්දු කරවීම, වැඩිදියුණු කිරීම සහ පහසුකම් සැලසීම මගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා දිරිගැන්වීම ;

(ආ) මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විදේශ වෙළෙඳපලවල් ජයග්‍රහණය කිරීමට හැකි දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තර කරණය කිරීමේ අරමුණින් ව්‍යවසායන් ශ්‍රී ලංකාවෙන් පිට පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම උනන්දු කරවීම සඳහා දිරිගැන්වීම ;

(ඇ) උචිත ලෙස සකස් කරන ලද ප්‍රතිපත්ති, සැළසුම්, උසස් කිරීමේ දිරිදීමනා සකස් කිරීම සහ කාර්මික සහ කෘෂිකර්මාන්තයේ වෙළෙඳාම සහ සංවර්ධනය සඳහා සක්‍රිය ලෙස උපකාර කිරීම සහ ඒවා වැඩිදියුණු කිරීම ;

(ඈ) ව්‍යවසාය සංවර්ධනයේ අත්‍යවශ්‍ය සංරචකයක් ලෙස තාක්ෂණික නිපුනතා සමග මානව ප්‍රාග්ධන සංවර්ධනය ජනතාව තුළ ඇති කිරීම ;

(ඉ) සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ;

(ඊ) ව්‍යවසාය සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මුදල් ලබා ගැනීම සඳහා ව්‍යවසායකයන්ට පහසුකම් සැලසීම ;

(උ) තාක්ෂණික දියුණුව, නිෂ්පාදන සංවර්ධනය සහ පේටන්ට් අයිතියේ වාණිජකරණයට අදාළ පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීම ;

(ඌ) ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම.

මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

**14**. අධිකාරියේ අරමුණු ක්‍රියාවට නැංවීමේ කාර්ය සඳහා මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ හැකි ය :—

(අ) අධිකාරියේ මතය අනුව අධිකාරියේ අරමුණු ඉටුවන හෝ එම අරමුණු ඉටු කිරීමට සහාය වන ව්‍යාපාරවල නියැලී සිටින හෝ නියැලී සිටීමට යෝජිත යම් තැනැත්තකු, හවුල් ව්‍යාපාරයක් හෝ සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීම සහ ඒවා සමග ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(ආ) කලාපීය කර්මාන්ත සහ ව්‍යාපාර කටයුතු භාර ගැනීමේ හැකියාව ඇති ඉලක්ක කොටගත් ව්‍යවසායකයන් හඳුනා ගැනීම සහ ඔවුන් දිරිමත් කිරීම ;

(ඇ) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්ය සඳහා කාර්මික වැඩබිම් හෝ කුඩා නගර සංවර්ධනය සඳහා ඉඩම් අත්කර ගැනීම හෝ බද්දට ගැනීම ;

(ඈ) විශේෂ ආර්ථික කලාප සංවර්ධනය කිරීම සඳහා අරමුදල් සහ සම්පත් ලබා දීම ;

(ඉ) ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය වැඩබිම්, කලාප, පරිශ්‍ර, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම ;

(ඊ) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම පහසුවීම සඳහා සමාගම් පිහිටුවීම හෝ ඒවායේ ආයෝජනය කිරීම ;

(උ) මෙහි මින් මතු සඳහන් කර ඇති ආකාරයට විශේෂ ආර්ථික කලාප ප්‍රකාශයට පත් කළ යුතු අතර, එම කලාප ව්‍යවසාය සංවර්ධනය සඳහා සංවර්ධන මධ්‍යස්ථාන විය යුතු ය ;

(ඌ) කුඩා හා මධ්‍යම පරිමාන ව්‍යවසාය සංවර්ධනය පහසු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තාක්ෂණ හා සංවර්ධන සේවා මධ්‍යස්ථාන පිහිටුවීම ;

(එ) සමාගම් පිහිටුවීම සඳහා ඒකාබද්ධ ව්‍යවසාය හවුල්කරුවන්ගේ ගාස්තු නියම කිරීම සහ ඉල්ලුම් කිරීමේ ක්‍රමය නියම කිරීම ;

(ඒ) රාජ්‍ය ආයතනවල මූල්‍ය ගනුදෙනුවලට අදාළව දැනට පවත්නා රජයේ මුදල් රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාත්මක කළ යුතු සහ උචිත යයි සලකනු ලබන බැංකුවක හෝ බැංකුවල, ගිණුමක් හෝ ගිණුම් විවෘත කොට පවත්වා ගෙන යාම ;

(ඔ) ව්‍යවසාය සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ, පළාත් පාලන ආයතන, පළාත් සභා හෝ ජාත්‍යන්තර සංවිධාන සමග සම්බන්ධීකරණය කිරීම ;

(ඕ) අදාළ බලධරයන්ගේ එකහත්වය ඇතිව විශේෂ ආර්ථික කලාප ඇතුළත සැලසුම් සහ භෞතික සංවර්ධනය ක්‍රියාත්මක කිරීම ;

(ක) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීමට ආනුෂංගික හෝ උපයෝගී වන සියලු ක්‍රියා හෝ දේ කිරීම.

යම් ගිවිසුමකට ඇතුළත්වීමට මණ්ඩලය සතු බලතල.

**15**. (1) අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ සහ ඉටු කිරීමේ කාර්ය සඳහා ඒකාබද්ධ ව්‍යවසාය ඇතුළු යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාර සමග යම් ගිවිසුමකට ඇතුළත්වීමේ බලය මණ්ඩලයට ඇත.

(2) එවැනි සෑම ගිවිසුමක්ම ලිඛිතව විය යුතු අතර එය අධිකාරියෙහි ලියාපදිංචි කරනු ලැබීමේ දී එමගින් අධිකාරිය සහ අදාළ රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හෝ වෙනත් මණ්ඩල අතර ඇති කර ගත් වලංගු සහ අනුගම්‍ය ගිවිසුමකින් සංයුක්ත වේ.

අධිකාරිය වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත දී ක්‍රියා කිරීම සඳහා තැනැත්තන්ට බලය පැවරීම.

**16**. අධිකාරියේ මුද්‍රාව යටතේ වූ ලියවිල්ලක් මගින් හෝ අධිකාරිය විසින් සාදන ලද රීති මගින් විධිවිධාන සලසා ඇති වෙනත් යම් ආකාරයකට ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයක දී සාමාන්‍යයෙන් හෝ යම් නිශ්චිත කරුණක් සම්බන්ධයෙන් අධිකාරිය සඳහා හෝ එය වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා මණ්ඩලය විසින් වෙනත් යම් තැනැත්තකුට බලය පවරනු ලැබිය හැකි ය

.

ඉඩම් අනිවාර්යයෙන් අත්කර ගැනීම.

**17**. (1) යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා යම් නාමෝද්දිෂ්ඨ ප්‍රදේශයක් තුළ යම් ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවක් අධිකාරියට අවශ්‍ය වන අවස්ථාවක දී සහ යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන අවස්ථාවක, එම ඉඩම හෝ ඉඩමේ සම්බන්ධතාව පොදු කාර්යයක් සඳහා අවශ්‍යවී ඇති ලෙස සලකා එම ඉඩම හෝ ඉඩමේ සම්බන්ධතාව (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගෙන අධිකාරිය වෙත පවරනු ලැබිය හැකි ය :

එසේ වුවද, යම් නාමෝද්දිෂ්ඨ ප්‍රදේශයක් තුළ පිහිටි යම් වත්තකට අයත් යම් ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවක් අධිකාරියට අවශ්‍යවන අවස්ථාවක, එම ඉඩම හෝ ඉඩමේ සම්බන්ධතාවය අත්කර ගැනීම සඳහා මේ වගන්තිය යටතේ නියමයක් පළ කිරීමට පෙරාතුව අමාත්‍යවරයා විසින්, වැවිලි යටිතල පහසුකම් විෂයය භාර අමාත්‍යවරයා විමසිය යුතු ය.

(2) අධිකාරියේ යම් කාර්යයක් සඳහා නාමෝද්දිෂ්ඨ ප්‍රදේශයක් තුළ පිහිටි යම් ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවක් (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීමට අවශ්‍යව ඇත්තා වූ ද, (1) වන උපවගන්තිය යටතේ වූ නියමය පළ කරනු ලැබූ දිනයේ සිට ආරම්භවන අවුරුදු තුනක කාලයක් ඇතුළත කවර හෝ විටක එකී ඉඩම හෝ එකී සම්බන්ධතාව අත්කර ගැනීමේ අදහස පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් එකී පනතින් නියම කර ඇති පරිදි පළ කරනු ලැබ ඇත්තා වූ ද, අවස්ථාවක දී, එකී ඉඩම් අත්කර ගැනීමේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, ඒ ඉඩම හෝ ඒ සම්බන්ධතාව වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල තීරණය කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය :—

(අ) ඒ ඉඩම අත්කර ගන්නා අවස්ථාවේ දී ඒ ඉඩම පවත්නා තත්ත්වය, එකී නියමය කරන ලද දිනයේ දී ඒ ඉඩමේ පැවති තත්ත්වයම වේ නම්, එදිනට ඒ ඉඩමට ලබා ගත හැකිව තිබුණු වෙළෙඳ අගයට, නියම කරන ලද දිනයෙන් පසුව ඒ ඉඩමට සද්භාවයෙන් කරන ලද වැඩි දියුණු කිරීම් කිසිවක් වේ නම් ඒවා සඳහා යුක්ති සහගත මුදලක්, එකතු කිරීමෙන් ලැබෙන අගය, ඒ ඉඩමේ වෙළෙඳ අගය ලෙස සැලකිය යුතු ය ;

(ආ) එකී නියමය කරනු ලැබූ දිනය ඒ ඉඩමේ පැවති වෙළෙඳ අගය නිශ්චය කිරීමේ දී, පනත ප්‍රකාර අධිකාරිය විසින් කරනු ලැබ ඇති යම් සංවර්ධන වැඩ හෝ වෙනත් කටයුතු හේතු කොට ගෙන සෘජු ලෙස හෝ වක්‍ර ලෙස උපචිත වූ යම් ප්‍රතිලාභයක් හෝ අගය වැඩිවීමක් සහ එසේ උපචිත විය හැකි යම් ප්‍රතිලාභයක් නැතහොත් අගය වැඩිවීමක් පිළිබඳ යම් බලාපොරොත්තුවක් සැලකිල්ලට නොගත යුතු ය.

**18**. රජයේ යම් චංචල දේපළක් අධිකාරියේ යම් කාර්යයක් සඳහා අවශ්‍යවන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් එම චංචල දේපළෙහි සන්තකය සහ භාවිතය අධිකාරිය වෙත පවරා සතු කළ යුතු ය : රජයේ චංචල දේපළ අධිකාරිය වෙත ලබාදිය යුතු බව.

එසේ වුව ද, රජයට අයත් යම් චංචල දේපළක් කෙරෙහි බලපාන කිසිම නියමයක්, ඒ දේපළෙහි පාලනය දරන අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, මේ වගන්තියේ ඉහතින්ම වූ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් නොකළ යුතු ය.

## මුදල්

**19**. (1) අධිකාරිය විසින් අරමුදලක් පිහිටුවා පවත්වාගෙන යා යුතු අතර- අධිකාරියේ අරමුදල.

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කර දෙනු ලබන සියලු මුදල් ;

(ආ) මේ පනත යටතේ අධිකාරිය විසින් එහි බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී අධිකාරියට ලැබෙන සියලු මුදල් ;

(ඇ) ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල් ; සහ

(ඈ) අධිකාරියේ බැරට උපචිත වන සියලු මුදල්,

අධිකාරියේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී අධිකාරිය විසින් දරනු ලබන වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සහ අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතු යයි නියමිත සියලු මුදල් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) අධිකාරිය විසින් තාක්ෂණ සංවර්ධන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. තාක්ෂණ සංවර්ධන කාර්ය සඳහා වෙන්කරන ලද හෝ ලැබෙන සියලු මුදල් එම අරමුදලට ගෙවනු ලැබිය යුතු ය. අධිකාරිය විසින් අරමුදලෙන් මුදල් ගෙවිය යුතු තාක්ෂණ සංවර්ධන ප්‍රදේශ හඳුනා ගත යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

**20**. (1) ලිත් වර්ෂය, අධිකාරියේ මුදල් වර්ෂය විය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සඳහා අදාළ වන්නේ ය.

**අධිකාරියේ කාර්ය මණ්ඩලය**

අධ්‍යක්ෂ ජනරාල්වරයා.

**21**. (1) අධිකාරියේ සභාපතිවරයා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා, මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට සහ පාලනයන්ට යටත්ව අධිකාරියේ කටයුතු සහ ගනුදෙනු, එහි බලතල, කර්තව්‍ය සහ කාර්යය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ කිරීම පිළිබඳ නියෝග සහ අධිකාරියේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පරිපාලනය සහ පාලනය භාරව සිටිය යුතු ය.

(3) මේ පනතින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබූ හෝ පනවනු ලැබූ හෝ භාර කරනු ලැබූ බලතල, කර්තව්‍ය හෝ කාර්ය කිසිවක් යම් නිලධරයකුට හෝ සේවකයකුට පැවරීම අවශ්‍ය යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා සලකන, යම් අවස්ථාවක දී, අධිකාරියේ අනුමතය ඇතිව, ඔහු විසින් ඒ බලතල, කර්තව්‍ය හෝ කාර්ය එසේ පවරා දෙනු ලැබිය හැකි අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, ඒ නිලධරයා හෝ සේවකයා විසින් ඒ බලතල, කර්තව්‍ය හෝ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කළ යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලය.

**22.** (1) අධිකාරියේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය විසින් සලකනු ලබන්නා වූ නිලධරයන් හා සේවකයන් අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයට සහ එසේ තීරණය කරනු ලබන ප්‍රමාණවලට අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, අධිකාරිය විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු, අධිකාරියේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ ද, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලබන යම් කාලයකට අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(4) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) යම් නිශ්චිත කාලයක් රජයට සේවය කිරීමට ගිවිසගෙන සිටින යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ යොදවනු ලබන යම් අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරියේ සේවය යම් කාලයක්, එකී ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා රජයට සේවය කළ කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු අධිකාරියේ ඉල්ලීම පිට ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ හා අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ හෝ අදාළ පළාත් පාලන

ආයතනයේ කැමැත්ත ඇතිව, අධිකාරියේ කාර්ය මණ්ඩලයට එවැනිම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලබන යම් කාලයකට අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ඇතුළුව හෝ අධිකාරිය සහ පළාත් පාලන සේවා කොමිෂන් සභාව හෝ එකී පළාත් පාලන ආයතනය විසින් එකඟවනු ලැබිය හැකි නියම හා කොන්දේසි මත අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(8) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු (7) වන උපවගන්තිය යටතේ අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් කවර වුවද සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ සාමාජිකයා හෝ නිලධරයා හෝ සේවකයා ද යටත් විය යුතු ය.

රාජ්‍ය සංස්ථාවල නිලධරයන් සහ සේවකයන් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත්කිරීම.

**23**. (1) රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු අධිකාරියේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව අධිකාරියේ කාර්ය මණ්ඩලයට එවැනිම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලබන යම් කාලයක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ කොන්දේසි ඇතුළුව, අධිකාරිය සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලය එකඟ වූ නියම හා කොන්දේසි මත, එවැනිම කැමැත්ත ඇතිව අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් කවර වුවද සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඔහු යටත් විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "පාලක මණ්ඩලය" යන යෙදුම යම් රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් යෙදී ඇති විටක, ඒ රාජ්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ඒ රාජ්‍ය සංස්ථාවේ පරිපාලනය සහ කළමනාකරණය පවරා දී ඇති අධ්‍යක්ෂ මණ්ඩලයක් හෝ වෙනත් යම් මණ්ඩලයක් අදහස් වේ.

## පොදු විධිවිධාන

**24**. කිසියම් විශේෂිත ආර්ථික කළාපයක සංවර්ධන ව්‍යාපෘතියක් කරගෙන යාම සඳහා අධිකාරිය විසින් යම් පුද්ගලයකුට දෙනු ලැබූ මූල්‍යාධාර කිසිවක් ඒ ආධාර දෙනු ලැබූ කාර්ය උදෙසාම යොදවනු ලබන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය සියලු පියවර අධිකාරිය විසින් ගත යුතු ය.

සංවර්ධන ව්‍යාපෘති කරගෙන යාම සඳහා දෙනු ලැබූ මූල්‍ය ආධාර එම කාර්ය සඳහා යොදවනු ලබන බවට අධිකාරිය වගබලා ගත යුතු බව.

**25**. අධිකාරියේ සාමාජිකයකු, හවුල්කරුවකු වන, අධ්‍යක්ෂවරයකු වන හෝ කොටස් හිමියකු වන හෝ අධිකාරියේ හවුල්කරුවකුට, අධ්‍යක්ෂවරයකුට හෝ කොටස් හිමියකුට වෙනත් යම් ආකාරයකින් සෘජුවම හෝ වක්‍රව සම්බන්ධතාවක් ඇති යම් ව්‍යවසායක ආයෝජනයක් හෝ වෙනත් ආකාරයකින් ඒ ව්‍යවසාය සමග ව්‍යාපාරික කටයුතු කිසිවක් හෝ ඒ ව්‍යාපාරික කටයුතු සඳහා අමාත්‍යවරයා විසින් අනුමතය දී ඇත්තේ නම් මිස, අධිකාරිය විසින් නොකළ යුතු ය.

අමාත්‍යවරයා විසින් අනුමත කර ඇත්නම් මිස අධිකාරියේ සාමාජිකයකුගේ සම්බන්ධතා ඇති ව්‍යවසායක් සමග අධිකාරිය ව්‍යාපාරික කටයුතු නොකළ යුතු බව.

**26**. (1) අමාත්‍යවරයා විසින් අධිකාරියේ කාර්ය කිරීමට සහ බලතල ක්‍රියාත්මක කිරීමට අදාළ පොදු හෝ විශේෂ විධාන අධිකාරිය වෙත ලිඛිතව දෙනු ලැබිය හැකි අතර අධිකාරිය විසින් ඒ විධාන පිළිපැදිය යුතු ය.

අමාත්‍යවරයාගේ විධාන.

(2) අධිකාරියේ දේපළ සහ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ආකෘති අනුව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියට ලිඛිතව විධාන කරනු ලැබිය හැකි අතර, එම විධානවලට අනුකූලව ක්‍රියා කිරීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

**27**. අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වන බව.

අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**28**. අධිකාරියේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

වියදම් ප්‍රතිපූරණය කිරීම.

**29**. (1) යම් අධිකරණයක් ඉදිරියෙහි අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරියට ගෙවන ලද හෝ අධිකාරිය විසින් අය කර ගන්නා ලද නඩු ගාස්තු කිසිවක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියෙහි ඔහුට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද වියදම් කිසිවක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගනු ලැබුවේ නම් මිස අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

නියෝග.

**30**. (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග අමාත්‍යවරයා විසින්, අධිකාරිය විමසා සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කොට ඇති වෙනත් යම් පසු දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු වුවද ඒ නියෝගය යටතේ ඊට පෙර කරන ලද යම් දෙයකට අගතියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

**31**. අධිකාරිය විසින්— රීති.

(අ) කාර්ය පටිපාටි විධිමත් කිරීම සහ රැස්වීම් කටයුතුවල යෙදීම සඳහා ;

(ආ) එහි මුද්‍රාව භාරයේ තබාගැනීමේ සහ මුද්‍රා තැබීමේ ආකාරය පිළිබඳව,

රීති සාදනු ලැබිය හැකි ය.

බදුගෙවීම් ආදියෙන් අධිකාරිය නිදහස් කිරීම.

**32**. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව රටේ කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන්ට ප්‍රධානත්වය දෙමින් ව්‍යවසාය සංවර්ධනය, දිරිගැන්වීම, ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැළසීම, ප්‍රතිපත්ති සහ ආයතනික සහන සැළසීමට අධිකාරියේ ආදායම හෝ ලාභ මත වූ ගාස්තු සහ අයකිරීම් කිසිවක් සහ බදු කිසිවක් ගෙවීමේ දී අවස්ථාවෝචිත පරිදි 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ නියමයන්ට අනුකූලව හෝ ඒ ගාස්තු අයකිරීම් හෝ ගාස්තු අයකිරීම හෝ බදු පැනවීම සඳහා තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක නියමයන්ට අනුකූලව අවසර දී ඇති යම් ප්‍රමාණයකට ඒ ගාස්තු අයකිරීම් සහ බදු ගෙවීමෙන් අධිකාරිය නිදහස් කරනු ලැබිය යුතු ය.

අධිකාරිය වෙත නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ වූ ඇතැම් බලතල පැවරිය යුතු බව.

**33**. (1) 12 වන වගන්තියේ නියමයන්ට අනුකූලව යම් ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීමෙන් පසු, අධිකාරිය වෙත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය බලතල පැවරිය යුතු ය.

(2) 12 වන වගන්තියේ නියමයන්ට අනුකූලව යම් ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීමෙන් පසු, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතට පටහැනිව කුමක් සඳහන් වුව ද, එම ප්‍රකාශිත කළාපය තුළ භෞතික සැළසුම් සම්බන්ධයෙන්, නාගරික සංවර්ධන අධිකාරිය වෙන් කර ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නියෝග සෑදීම නීත්‍යානුකූල විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**34**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල, භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

අර්ථ නිරූපණය.

**35**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි-

"සංවර්ධන ව්‍යාපෘති" යන්නෙන්, 12 වන වගන්තියට අනුකූලව ප්‍රකාශිත කිසියම් විශේෂිත ආර්ථික කළාපයක, නිෂ්පාදනය, ආදායම් හෝ රැකියා උත්පාදනය කරන්නා වූ හෝ අන්‍යාකාරයකින් ආර්ථික, සමාජ, සංස්කෘතික හෝ පාරිසරික තත්ත්වයන් වැඩි දියුණු කරන්නා වූ යම් පොදු හෝ පෞද්ගලික ක්‍රියාකාරකමක් අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන බලතලවලට, කරනු ලබන කාර්යවලට සහ ඉටු කරනු ලබන කර්තව්‍යවලට අනුරූපී හෝ සමාන බලතල, කාර්ය හා කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට යම් නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ.

උපලේඛනය (12 (4) වන වගන්තිය)

1. සමාගමේ පරමාර්ථ-

(අ) විශේෂ ආර්ථික කළාප තුළ ඒවායේ සීමාවන් යටතේ ආර්ථික සංවර්ධනය ආශ්‍රිත ක්‍රමෝපායන මාර්ග ප්‍රවර්ධනය කිරීම ;

(ආ) විශේෂ ආර්ථික කළාප තුළ එහි සීමාවන් යටතේ කෘෂිකාර්මික සේවා සහ වෙළෙඳ කටයුතු දිරිගැන්වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) පෘථුල සහ ශක්තිමත් ආර්ථික පදනමක් ඇති කිරීම වේ.

2. සමාගමේ කර්තව්‍යයන් සහ බලතල-

(අ) කළාප තුළ කාර්මික, කෘෂිකාර්මික සහ වෙළෙඳ ව්‍යාපාර පිහිටුවීම සහ ඒවා ව්‍යාප්ත කිරීම, දිරිගැන්වීම සඳහා පහසුකම් සැළසීම ;

(ආ) දේශීය ව්‍යවසායකයන්, සුළු හා මධ්‍යම වෙළෙඳ ව්‍යාපාරයන් වැඩිදියුණු කිරීමට සහාය වීම සහ දේශීය සමාගම් ව්‍යාප්ත කිරීමට සහ නගා සිටුවීමට අනුග්‍රහ දැක්වීම ;

(ඇ) ශ්‍රී ලංකාව තුළ කළාපීය සේවා සහ ව්‍යාපාර කටයුතු පුළුල් පරාසයක පවත්වාගෙන යාමට ඉලක්ක කරගත් සමාගම් හඳුනාගැනීම සහ ඒවා දිරිමත් කිරීම ;

(ඈ) සහාය කාර්මික සේවා වැඩිදියුණු කිරීම් ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා අනුග්‍රහ දැක්වීම ;

(ඉ) කලාපය තුළ, කාර්මික, කෘෂිකාර්මික සහ ව්‍යාපාර කටයුතු සඳහා අවශ්‍ය භූමිය කලාප වශයෙන් වෙන් කළ කොටස, කොටස්, ඉඩම් හා වෙනත් පරිශ්‍ර සහ අනෙකුත් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ කළමනාකරණය කිරීම.

(ඊ) තාක්ෂණය, පුහුණුකිරීම්, පර්යේෂණ සහ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම්වල ආයෝජනය කිරීමෙන් ඔවුන්ගේ දක්ෂතා සහ තාක්ෂණික මට්ටම් නංවාලීමට කාර්මික සහ කෘෂිකාර්මික ව්‍යාපාර දිරිමත් කිරීම ;

(උ) කාර්මික ගම්මාන වැඩිදියුණු කිරීමට සහ කළමනාකරණය කිරීමට සැළසුම් සකස් කිරීම ;

(ඌ) ඒ ප්‍රදේශ තුළ වාසය කරන තැනැත්තන්ගේ දියුණුව සහ යහපැවැත්ම උදෙසා සමාජ පහසුකම් සැලසීම ; සහ

(එ) බැංකු සහ වෙනත් ණය දෙන ආයතනවලින් මුදල් ණයට ලබාගැනීම.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.